ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2002 අංක 19 දරන කර්මාන්තශාලා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කලේ 2002 ඔක්තෝබර් මස 04 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 ඔක්තෝබර් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.50 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

**2002 අංක 19 දරන කර්මාන්තශාලා (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2002 ඔක්තෝබර් මස 04 වන දින]

එල්. ඩී.–ඕ. 46/2000.

**කර්මාන්තශාලා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2002 අංක 19 දරන කර්මාන්තශාලා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. කර්මාන්තශාලා ආඥාපනතේ 68 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :– 128 වන අධිකාරයේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

"(1) යම් කර්මාන්ත ශාලාවක ඇති අධික වැඩ ප්‍රමාණය, වැඩ කරන පැය ගණන සහ සේවා නියුක්තිය පිළිබඳ කාලසීමාවන්ට අදාළව මේ කොටසෙහි විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කාන්තාවන් සහ වයස අවුරුදු දහසය සම්පූර්ණ වූ එහෙත් වයස අවුරුදු දහ අට සම්පූර්ණ නොවූ තරුණ අය, අතිකාල සේවයෙහි නියුක්ත කිරීම මගින් ඉටුකර ගත හැකිය :

එසේ වුව ද කාන්තාවක් විසින් යම් ලිත් මාසයක් තුළ දී කරනු ලබන අතිකාල පැය ගණනෙහි එකතුව පැය හැටක් නොඉක්මවිය යුතු අතර වයස අවුරුදු 16 සම්පූර්ණ වූ එහෙත් වයස අවුරුදු 18 සම්පූර්ණ නොවූ තරුණ අයකු යම් ලිත් මාසයක් තුළ කරනු ලබන අතිකාල පැය ගණනෙහි එකතුව පැය පනහක් නොඉක්මවිය යුතු ය.".

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(අ) කාන්තාවක් හෝ තරුණ අයකු විසින්, අතිකාල සේවයේ යෙදුන කාලසීමාව ඇතුළුව එහෙත් ආහාර අනුභවය සහ විවේකය සඳහා අවසර දී ඇති විවේක කාලය අත්හැර, යම් සතියක් තුළ වැඩ කරන මුළු පැය ගණන පැය හැටක් නොඉක්ම විය යුතු ය.;".

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :–

"(2ඇ) සේවා යෝජකයකු විසින්, අතිකාල සේවයෙහි යෙදීම සඳහා ඇයගේ කැමැත්ත ලිඛිතව දෙනු ලබන්නේ නම් මිස –

(අ) ගර්භනී කාන්තාවක් ඇයගේ ගර්භනී කාලය තුළ ; සහ

(ආ) කිරිදෙන මවක් ඇයගේ දරුවා උපත ලද දිනයේ සිට ගණන් බලනු ලබන එක් අවුරුද්ද කාලසීමාවක් සඳහා ; සහ

(ඇ) මළ දරුවකු බිහිකළ කාන්තාවක් ඇය මළ දරුවා බිහි කළ දින සිට ගණන් බලනු ලබන මාස තුනක කාලසීමාවක් සඳහා,

අතිකාල සේවයෙහි යෙදවීම නොකළ යුතු ය.".

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

(4) අමාත්‍යවරයා විසින් –

(අ) යම් කාන්තාවක් හෝ තරුණ අයකු අතිකාල සේවයෙහි යෙදවීම මගින් ඒ කාන්තාවගේ හෝ තරුණ අයගේ ශරීර සෞඛ්‍යයට අහිතකර බලපෑමක් ඇතිවන බව පෙනී යන්නේ නම්, එම කාන්තාව හෝ තරුණ අය හෝ ඔවුන්ගේ යම් පන්තියක් අතිකාල සේවයෙහි යෙදවීම තහනම් කිරීම හෝ සීමාකිරීම ;

(ආ) කාන්තාවක් හෝ තරුණ අයකු කර්මාන්ත ශාලාවක් තුළ අතිකාල සේවයෙහි යොදවනු ලබන කාලය තුළ විවේකාගාර පහසුකම් සැලසීම ඇතුළු එම කර්මාන්ත ශාලාව ඇතුළත පවත්වාගෙන යා යුතු සේවා තත්ත්වයන් ;

(ඇ) රාත්‍රි කාලයේ දී අතිකාල සේවයේ යොදවනු ලබන කාන්තාවන්ට ගමන් පහසුකම් සැලසීමේ ආකාරය,

නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.